# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2092/2 - 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා - 2018.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

එල්.ඩී.බී. 3/2006

### 2006 අංක 6 දරන මුදල් ගනු දෙනු වාර්තා කිරීමේ පනත

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති.

මූල්‍ය බුද්ධි ඒකකය

කොළඹ දී ය.

රීති

2016 ජනවාරි මස 27 වන දින අංක 1951/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනු දෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 68 වන රීතිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"68. සෑම මූල්‍ය ආයතනයක් විසින් ම, විද්‍යුත් ප්‍රේෂණවල දී, නම් කළ තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් සහ එම නම් කළ තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් වෙනුවෙන් හෝ ඔවුන් ගේ විධානය යටතේ ක්‍රියාකරනු ලබන හෝ එම නම් කළ තැනැත්තන් ගේ හෝ ආස්ථිත්‍යයන්ගේ ප්‍රතිලාභය සඳහා ක්‍රියාකරනු ලබන වෙනත් තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් මත, ත්‍රස්තවාදය සහ ත්‍රස්වාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූලඝාතක අවි ව්‍යාප්තිය සහ ඊට මුදල් සැපයීම සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක පැනවීමට අදාළව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ යෝජනා සම්මුති ක්‍රියාවට නංවමින් 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට අනුව හෝ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභාවේ වෙනත් යම් යෝජනා සම්මුතියක් ක්‍රියාවට නංවමින් එකී පනතේ යටතේ සාදන ලද වෙනත් යම් නියෝගයකට අනුව, ක්‍රියාවිරහිත කිරීම සහ ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් වන තහනම් කිරීම්වලට අනුකූලව ක්‍රියාකිරීම සිදු කළ යුතු ය.";සහ

(2) එහි 95 වන රීතිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"95. සෑම මූල්‍ය ආයතනයක් විසින් ම ත්‍රස්තවාදය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූලඝාතක අවි ව්‍යාප්තිය සහ ඊට මුදල් සැපයීම සම්බන්ධයෙන් ඉලක්ක ගත මූල්‍ය සම්බාධක පැනවීමට අදාළව 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත අනුව සාදන ලද යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද නම් කළ තැනැත්තන් ගේ හෝ ආස්ථිත්‍යයන් ගේ ලැයිස්තුවක, යම් අපේක්ෂිත ගනුදෙනුකරුවකු ගේ හෝ ප්‍රතිලාභියකුගේ නම ඇතුළත්ව තිබේද යන්න හෝ එවන් යම් අපේක්ෂිත ගනුදෙනුකරුවකු හෝ ප්‍රතිලාභියකු, එම නම් කළ තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් වෙනුවෙන් හෝ ඔවුන්ගේ විධානය යටතේ ක්‍රියාකරනු ලබන්නේ ද යන්න හෝ එම නම් කරන ලද තැනැත්තන්ගේ හෝ ආස්ථිත්‍යයන් ගේ ප්‍රතිලාභය වෙනුවෙන් ක්‍රියාකරනු ලබන්නේ ද යන්න තහවුරුකර ගනු ලැබිය යුතු ය.".

10 - 1236